**තංගල්ල නගර සභාව - 2022**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

තංගල්ල නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට කඩ කාමර බදුදීමෙන් ලද රු. 2,788,747 ක් වූ එක්වන් මුදල් ආදායමක් ලෙස ගිණුම්ගත නොකර මිශ්‍ර තැන්පතු යටතේ වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය පරිදි වසර 05 ඉක්මවූ පසු ආදායමට ගන්නා බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සේවක ණය වටිනාකම රු. 110,668 ක් අඩුවෙන් දැක්වුණි. | ලැබිය යුතු ණය ශේෂයන් ඉදිරියේදී නිරවුල් කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | තංගල්ල බස් නැවතුම්පල කඩකාමර 21 සඳහා ඉකුත් වර්ෂ වලට අදාළ රු. 543,400 ක කඩකුලී ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | අයනොකිරීමට සභාව තීරණය කළ බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපූර්ණය නොවූ සේවක වැටුප් වියදම් රු. 200,984 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල් ප්‍රතිපූර්ණය කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේදී කැබ් රථයක් අනතුරට ලක්වීම මත රක්ෂණ සමාගමෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු. 3,195,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 3,943,500 ක් අඩුවෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතු වටිනාකම රු. 660,367 ක් වූ තොග අයිතම 89 ක් ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කරන බව. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නගර සභා ආඥා පනත | | | |
| i. | 157 වගන්තිය | නගර සභා ආඥා පනත යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, කාරණා 2 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | 165 ආ (1)අ වගන්තිය | බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ටාර් වැනි වෘත්තීන් කරගෙන යනු ලබන තැනැත්තන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | වෘත්තීය බදු පනවා අයකර ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. | 171 වගන්තිය | රිට් ආඥාව ලද 2019 ඔක්තෝබර් 03 දින සිට 2022 මාර්තු 31 දක්වා ලැබිය යුතු රු. 783,768 ක කඩකාමර කුලී දඩ මුදල් අය නොකර දරිද්‍රතාව මත කපා හැරීමට 2022 මැයි 31 දින සභා අනුමැතියක් ලබාගෙන තිබුණි. | සභා තීරණය අනුව බිල්කළ දඩ මුදල් කපා හැරීම සිදුකළ බව. | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iv. | 227(i) වගන්තිය | සභාවේ සභියකයකු 2008 වර්ෂයේ සිට මේ දක්වා බස් නැවතුම් පල පිහිටි සභාවට අයත් S-01 දරන කඩ කාමර මගින් බදුකරු ලෙස ගිවිසුම් ගත වී ඇත. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 8,775,520 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.14,704,440 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,050,000 | 7,439,833 | 7,136,825 | 4,991,704 | 7,050,000 | 6,703,656 | 6,077,456 | 4,688,696 |
| කුලී | 17,734,900 | 17,262,075 | 20,314,140 | 12,835,692 | 16,364,400 | 16,945,245 | 10,476,810 | 15,887,757 |
| බලපත්‍ර ගාස්තු | 743,000 | 1,032,979 | 950,979 | 227,000 | 953,000 | 578,010 | 603,010 | 145,000 |
| වෙනත් ආදායම් | 10,649,400 | 11,891,390 | 14,544,763 | 1,035,835 | 10,633,400 | 10,703,310 | 10,906,259 | 3,689,208 |
| **එකතුව** | 36,177,300 | 37,626,277 | 42,946,707 | 19,090,231 | 35,000,800 | 34,930,221 | 28,063,535 | 24,410,661 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 1,163 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.4,544,709 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා රතු නිවේදන නිකුත් කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් බදු හිඟ ශේෂය තුළ හිඟය රු. 5,000 සිට රු. 50,000 වැඩි ඒකක ගණන 152 ක් වුවත් එම හිඟයන් අයකර ගැනීමට නගර සභා ආඥා පනත අනුව කටයුතු කර නොතිබුණි. | අය නොවන ශේෂ සඳහා රතු නිවේදන යැවීමට සහ දේපළ තහනමට ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ව්‍යාපාර ඒකක 112 කට අදාළ ව්‍යාපාර බදු රු. 287,440 ක් හා කර්මාන්ත 13 කට අදාළ කර්මාන්ත බදු රු. 19,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩකාමර 108 කින් ලැබිය යුතු කඩකුලී රු. 8,887,397 ක් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවසන් දැනුම් දීම් ලිපි යවා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ටෙන්ඩර් කර බදුදෙන ජනතා පොළ, ගවමස් කඩය හා පරෙයිවැල්ලෙන් ලැබිය යුතු රු. 754,366 ක් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 අ (1) හා (2) වගන්ති පරිදි කටයුතු කර නොතිබුණි. | රු. 390,341 ක් ඉදිරියේදී කපා හැරීමට සහ ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි බදු දීමෙන් ලැබිය යුතු රු. 3,193,328 ක් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (උ) | සභාව විසින් බදුකරුවන් සමඟ අත්සන් කරන ලද ගිවිසුම හා 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස, | | |
| i. | සභාව සතු තංගල්ල බස් නැවතුම්පොල කඩකාමර 07 ක් 2016 හා 2022 වර්ෂයන් අතර කාලය තුල අතුරු බදුදී තිබුණද ඒ සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට සභා කළමණාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | අතුරු බදුදීම් සිදුකර ඇත්නම් සභාවට කඩ කාමර භාරදෙන ලෙස ලිඛිතව දැනුම් දීම් සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| ii. | තංගල්ල බස් නැවතුම්පොළ කඩ කාමර 14 ක කුලී අයකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම මත රු. 904,472 ක කඩකුලී අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | *හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරන බව.* | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 91 කට අදාළව ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 109,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 118,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් රථගාල් වලින්, ගිනි හා ආපදා ඒකකයෙන් සහ ගිලන් රථවලින් ලැබිය යුතු එකතු ආදායම රු. 366,505 ක් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 අ (1) හා (2) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුම්දීම් සිදුකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 හා 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 26 වෙනි වගන්තියට අනුව පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීමට අදාළ බලතල 2022 පෙබරවාරි 27 දිනැති අංක 14/01/1423/2022 දරණ මධ්‍යම පරිසර අධිකාරි සභාපතිගේ ලිපිය මඟින් 2022 පෙබරවාරි මස 24 දින සිට සභාව වෙත පවරාදී තිබුණද සභාව විසින් පරිසර බලපත්‍ර ගාස්තු අය නොකිරීමට තීරණය කර තිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ගන්නා බව. | පනත අනුව කටයුතු කළ යුතුය. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ලේඛනය මගින් සභාව විසින් ඉටු කිරීමට සැලසුම් කර තිබූ රු.4,100,000 ක් වූ සංවර්ධන යෝජනා 02 ක් නගර සභාව සතුව ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන තිබියදී ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවේ කටයුතු වළක්වාලමින් ලබාදී තිබූ උසාවි නියෝගය සහ සභාවේ අනුමැතිය හිමි නොවීම මත මෙම කර්මාන්ත ඉටු නොකළ බව. | අයවැයගත සංවර්ධන යෝජනා ඉටුකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 මැයි 13 දින අනුමැතියකින් තොරව ගමන් කරමින් සිටියදී අනතුරට පත් වී තිබූ සභාපතිවරයා විසින් භාවිතා කළ කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) අනුව සකස් කළ පූර්ණ වාර්තාව පරිදි අලුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තුගත මුළු වියදම රු.6,154,088 ක් වුවද රක්ෂණ ආයතනයෙන් සම්පූර්ණ වන්දි මුදල ප්‍රතිපූර්ණය නොවීම මත නගර සභා අරමුදලට සිදුවූ පාඩුව රු. 2,959,088 ක් විය. | නඩු කටයුතු අවසන් වීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන අතර ලිපියේ විධි විධාන වලින් බැහැරව සභාපතිවරයා විසින් රථය භාවිතා කර ඇති බව. | සිදුව ඇති අලාභය සම්බන්ධයෙන් මු.රේ. 104(4) නිර්දේශ අනුව කටයුතු කළයුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ධුරයෙන් ඉවත් කළ සභිකයකු සභා රැස්වීම් වලට සහභාගි කරවා ගැනීම වෙනුවෙන් 2022 වර්ෂයේ මාස 06 කාල පරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු. 114,661 ක් වූ සභික දීමනා, ඉන්ධන දීමනා සහ දුරකථන දීමනා ගෙවා තිබුණි. | පවත්නා නීතිරීති අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 102-104 විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | තංගල්ල පැරණි පොළ භූමියේ 2021 නොවැම්බර් මස තෙදිනක් තුල පැවති අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන සඳහා භාවිතය වෙනුවෙන් පොළ භූමියෙහි පොදු රථගාල සඳහා වෙන්කළ වර්ග අඩි ප්‍රමාණය හැර ඉතිරි වර්ග අඩි ප්‍රමාණයෙන් සහ බැනර් වෙනුවෙන් ලැබිය යුතු රු. 688,500 ක් සහා කළමනාකාරීත්වයේ නොසැලකිල්ල මත සභාවට අහිමිවී තිබුණි. | කොඩි කණු වලින් ගාස්තු අයකිරීමට ගැසට් කර නොමැති බව. | ගාස්තු අය කිරීම අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නගර සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් 22 ක හා ගොඩනැගිලි 05 ක නීත්‍යානුකූල අයිතිය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කළ බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තංගල්ල නගර ශාලාව නවීකරණය කිරීමේ කර්මාන්තය අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවාගෙන රු.1,606,305 ක් ගෙවීම් කර තිබුණි. | | |
| i. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.2 ඡේදයට අනුකූළ නොවන ලෙස ඉදිකිරීම් වැඩ නොවන නගර ශලාවේ ශබ්ද පරිපාලන පද්ධතිය සැකසීම හා තිරරෙදි දැමීම යන කාර්යයන්ද පවරා තිබූ අතර කොන්ත්‍රාත් සමිතිය විසින් එම කාර්යයන් බාහිර ආයතන දෙකක් මගින් ඉටුකරවා ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| ii. | නගර ශාලාව සඳහා වොට් 12.5 ප්‍රමාණයේ LED බල්බ් 50 ක් සපයා සවිකල බව දක්වමින් රු.283,400 ක් ගෙවීම් කර තිබුණද ඊට අනුකූළ නොවන බල්බ සපයා සවිකිරීම වෙනුවෙන් සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් නැවත අයකර ගත යුතුය. |
| (ආ) | මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය යටතේ කොන්ක්‍රීට් කැබලි (Cover slab) 203 ක් සපයා සවිකිරීම වෙනුවෙන් රු.1,398,386 ක් ගෙවීම් කර තිබූ අතර කොන්ක්‍රිට් කැබලි වල සම්පීඩ්‍යතා ශක්තිය නියමිත ප්‍රමාණයට නොතිබියදී සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. | නව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගෙවීම් කිරීමට පෙර සම්පීඩ්‍යතාවය පිළිබඳ වාර්තා ලබාගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයේ පැවැති අතිරික්තතා 36 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ද්විතීයික මට්ටමේ පවතින අතිරික්තතා 18 පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කළ බව. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2012 හා 2016 වර්ෂයන් වලදී මිය ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 5,000 ක උත්සව අත්තිකාරම් හා රු. 46,135 ක ආපදා ණය අයකර ගැනීම සඳහා කළමනාකාරීත්වය විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |